# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2177/3 - 2020 මැයි මස 26 වැනි අඟහරුවාදා - 2020.05.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 8/2007 (II)

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 36 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) සහ (ඉ) ඡේද සමග කියවිය යුතු එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද අමරවීර,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2019 අංක 2 දරන උපකරණවල බලශක්ති කාර්ය සාධන ප්‍රමිති (ආලෝක විමෝචන දියෝඩ (එල්ඊඩී) විදුලි පහන්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති (එස්එල්එස්) 1530:2016හි නිශ්චිතව දක්වා ඇති සහ මෙහි 1 වන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිවලට අනුකූල නොවන්නා වූ යම් එල්ඊඩී විදුලි පහනක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීම හෝ නොකළ යුතු ය.

3. 2 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති සහ මෙහි කිසිම තැනැත්තකු විසින් මෙහි 1 වන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති ප්‍රමිතිවලට අනුකූලවන්නා වූ යම් එල්ඊඩී විදුලි පහනක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන සෑම තැනැත්තකු විසින්ම ශ්‍රී ලංකා ප්‍රමිති (එස්එල්එස්) 1530:2016හි නිශ්චිතව දක්වා ඇති සහ මෙහි 11 වන උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති ආකෘතිය, මිණුම් සහ ප්‍රමාණයට අනුකූල වන්නා වූ අවම බලශක්ති කාර්ය සාධන ලේබලයක් (එම්ඊපී) එම විදුලි පහන අසුරා ඇති කවරයෙහි හෝ දවටනයෙහි හෝ පෙට්ටියෙහි අලවා තැබිය යුතු ය.


1A - PG 4983 — 167 (2020/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති (එස්එල්එස්) 1530:2016 ලෙස නිශ්චිතව දක්වා ඇති බලශක්ති කාර්ය සාධන ප්‍රමිතිවලට අනුකූලවන බවට සහතික කිරීමේ කාර්යය සඳහා, අදළ ආනයනකරු හෝ නිෂ්පාදකයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ආනයනය කරනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන යම් එල්ඊඩී විදුලි පහනක් ශ්‍රී ලංකා ප්‍රමිති (එස්එල්එස්) 1530:2016 නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුකූලවන බවට සහතික කරමින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කරන ලෙස යම් එල්ඊඩී විදුලි පහන් ආනයනකරුවෙකුට හෝ නිෂ්පාදකයෙකුට නියම කිරීම සඳහා අධිකාරියට බලය තිබිය යුතු ය. එසේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක්, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් එය බැලූ බැල්මට පෙනෙන සාධකයක් වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

5. කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන මේ නියෝගවල 3 වන නියෝගය මගින් පනවන ලද නියමයන්ට අනුකූල නොවන්නා වූ යම් බලශක්ති ලේබලයක් අදළ විදුලි පහන අසුරා ඇති කවරයෙහි හෝ දවටනයෙහි හෝ පෙට්ටියෙහි අලවා ඇති යම් එල්ඊඩී විදුලි පහනක් ගබඩා කිරීම, ප්‍රදර්ශනය කිරීම, තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදහැරීම සිදු නොකළ යුතු ය.

6. මෙහි නියෝගවල -

"පනත" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත අදහස් වේ.

"අධිකාරිය" යන්නෙන් 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අදහස් වේ.

"ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය" යන්නෙන් 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අදහස් වේ.

1 වැනි උපලේඛනය

(2,3,4 නියෝග)

SLS 1530:2016 ලෙස නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා ප්‍රමිතියෙහි විෂය ක්ෂේත්‍රය යටතේ නිශ්චිතව දක්වා ඇති LED විදුලි පහන්.

2 වැනි උපලේඛනය

(3 වැනි නියෝගය)

1 වැනි රූපය: අවම බලශක්ති කාර්යසාධන ලේබලය



2 වැනි රූපය: බලශක්ති ලේබලයේ සැබෑ පරිමාණය




3 වැනි රූපය : ලේබලයේ මිනුම් ප්‍රමාණයන්



4 වැනි රූපය: ලේබලයේ අකුරුවල ප්‍රමාණයන්




5 වැනි රූපය: ලේබලයේ වර්ණ සංයෝජනය




06 - 22